# උපදේශකයින් තෝරා ගැනීම

## සුළු පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP)

## කෘෂිකර්ම අමාත්‍යාංශය

1. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) හා ශ්‍රී ලංකා රජය විසින් එක්ව අරමුදල් යොදවනු ලබන සුළු පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන වැඩසටහනකි. මෙම SAPP වැඩසටහන ශ්‍රී ලංකාවේ සුළු කර්මාන්ත ව්‍යවසායකයින්ගේ දුගී බව පිටු දැකීම හා තරගකාරීත්වය වර්ධනය කිරීම උදෙසා දායකත්වයක් සපයන ව්‍යාපෘතියකි. මෙම වැඩසටහන දියත් කිරීමේ මූලික අරමුණ වන්නේ වෙළඳපොළ ඉලක්ක කරගත් නිෂ්පාදනයන්හි නියැලෙන 57,500 ක සුළු කර්මාන්තයන්හි නියැලෙන නිවැසියන්ගේ තිරසාර ආදායම් තත්ත්වය වර්ධනය හා ඔවුන්ගේ ආහාර වේලෙහි ගුණාත්මක බව වර්ධනය කිරීමයි. මෙම SAPP වැඩසටහන ශ්‍රී ලංකා රජයේ (GOSL) ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය, පෞද්ගලික, නිෂ්පාදක සහභාගීත්ව (4Ps) ක්‍රමවේදය යටතේ ග්‍රාමීය සංවර්ධනය සඳහා උපයෝගී කරගනී.

පහත තනතුරු සඳහා සුදුසු අයදුම්කරුවන් ඉහළ අපේක්ෂා සහිත ප්‍රතිඵලදායක, සඵල නායකත්වයක් හා බේරුම් කිරීමේ හැකියාව ඇති, සුවිශේෂී කණ්ඩායම් කළමනාකරණ හා අතිවිශිෂ්ඨ අන්තර්පුද්ගල හැකියාවන්ගෙන් යුක්ත විය යුතුය.

**(1) ජ්‍යෙෂ්ඨ උපදේශක (කෘෂි ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම) (පූර්ණ කාලීන පදනම) - තනතුරු 01 යි.**

**සුදුසුකම් හා පළපුරුද්ද**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් කෘෂිකර්ම, කෘෂි ආර්ථික, ව්‍යාපාර කළමනාකරණ, සංවර්ධන අධ්‍යයන, වෙළඳපොළ කළමනාකරණ යන අංශ සඳහා ලබාගත් විද්‍යාවේදී උපාධිය සමග කෘෂි ව්‍යාපාර හා ව්‍යාපෘති සංවර්ධන විෂය පථයේ අවම අවු. 12 ක පළපුරුද්ද.

(i) කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහි පළපුරුද්ද.

(ii) ව්‍යාපාරික යෝජනා දියුණු කිරීමේ පළපුරුද්ද, නිෂ්පාදන සංවිධාන, ගොවි සංවිධාන ආයතනවල ව්‍යාපාර නගා සිටුවීමේ හැකියා ප්‍රවර්ධනය පිළිබඳ පුහුණු කිරීම් දියත් කිරීම හා සකස්කිරීම.

(iii) දායක අරමුදල් ව්‍යාපෘතිවල හා ඒ හා සමාන පැවරුම් සිදුකර තිබීම වාසිසහගත සුදුසුකමක් වනු ඇත.

(iv) ශක්තිමත් සංවිධානාත්මක හැකියාව හා ක්‍රියාශීලීව විවිධ තත්ත්වයන් යටතේ කණ්ඩායම් හැඟීමෙන් වැඩ කිරීමේ හැකියාව

**(2) උපදේශක - ව්‍යාපාර සංවර්ධන (පූර්ණ කාලීන පදනම) - තනතුරු 01 යි**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් කෘෂිකර්ම, කෘෂි ආර්ථික, ව්‍යාපාර කළමනාකරණය, සංවර්ධන අධ්‍යයන, වෙළඳපොළ කළමනාකරණය සඳහා ලබාගත් විද්‍යාවේදී උපාධිය සමග කෘෂි ව්‍යාපාර හා ව්‍යාපෘති සංවර්ධන ක්ෂේත්‍රයේ අවම අවු. 10 ක වෘත්තීය පළපුරුද්ද.

(i) කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහි පළපුරුද්ද.

(ii) ව්‍යාපාරික යෝජනා දියුණු කිරීමේ පළපුරුද්ද, නිෂ්පාදන සංවිධාන හා ගොවි සංවිධාන ආයතනවල ව්‍යාපාර නාගාසිටුවීම, හැකියා ප්‍රවර්ධනය පිළිබඳ පුහුණුකිරීම් දියත් කිරීම හා සකස්කිරීම.

(iii) දායක අරමුදල් ව්‍යාපෘතිවල මේ හා සමාන පැවරුම් සිදුකර තිබීම වාසි සහගත වනු ඇත.

(iv) ඉංග්‍රීසි භාෂාවෙන් ලිවීම, කථාකිරීම හා වැඩකිරීමේ හැකියාව සමග Microsoft office පැකේජයක් තුළ නිදහසේ වැඩ කිරීමේ හැකියාව.

**(3) උපදේශක (ආවේක්ෂණ හා ඇගයීම් - දත්ත විශ්ලේෂණ හා වාර්තාකරණ (අර්ධ කාලීන පදනම) තනතුරු 01 යි.**

(i) විද්‍යාවේදී උපාධිය හෝ ඉහළ උපාධිය (පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රථම උපාධිය හැදෑරීමෙන් පසු ලබාගත්) ව්‍යාපාර හෝ රාජ්‍ය කළමනාකරණ, සංඛ්‍යාන, ආර්ථික විද්‍යා, ග්‍රාමීය සංවර්ධන, දේශපාලන විද්‍යා, ව්‍යාපෘති කළමනාකරණ හෝ සමාන ක්ෂේත්‍රයක ලබාගත් උපාධිය.

(ii) ICT (තොරතුරු තාක්ෂණ) පිළිබඳ හැදෑරීමත් තිබීම වාසිසහගත වනු ඇත.

(iii) ව්‍යාපෘති කළමනාකරණ / ආවේක්ෂණ හා ඇගයීම් හා කළමනාකරණ මට්ටමේ අවම අවු. 05 ක පළපුරුද්ද තිබීම.

(iv) දායක අරමුදල් ආයතන තුළ වාර්තාකරණය ක්ෂේත්‍රයේ පළපුරුද්ද (IFAD ප්‍රතිඵල හා ගැටුම් කළමනාකරණය පළපුරුද්ද) තිබීම වාසිසහගත වනු ඇත.

**4. උපදේශක (ව්‍යාපාර සංවර්ධන (කෘෂිකර්ම යටිතල පහසුකම් සංවර්ධන) ආර්ධකාලීන පදනම) තනතුරු 01 යි.**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

(i) සිවිල් හා යාන්ත්‍රික ක්ෂේත්‍රයේ අනුමත විශ්වවිද්‍යාලයකින් ඉංජිනේරුවකු ලෙස මූලික සුදුසුකම් සමග ග්‍රාමීය ව්‍යාපෘති සංවර්ධන ක්ෂේත්‍රයේ අවම අවු. 05 ක වෘත්තීය පළපුරුද්ද.

(ii) යන්ත්‍රසූත්‍ර / උපකරණ හා ගොඩනැගිලි සේවා හා වාරිමාර්ග (කෘෂි - මාර්ග, ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම) සම්බන්දව ඇස්තමේන්තු සෑදීම / BOQ / ඇඳීම් පිළිබඳ අඩුම වශයෙන් අවු. 2 ක පළපුරුද්ද.

(iii) කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහි පළපුරුද්ද.

(iv) වෙනත් විවිධ ක්ෂේත්‍රයන්හි (කෘෂිකර්ම, යන්ත්‍රෝපකරණ / වාරිමාර්ග) ප්‍රවීනයන් / නිලධාරීන් සමග වැඩකිරීමෙන් ලබාගත් පළපුරුද්ද තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**ඉහළ සියලු තනතුරු සඳහා අවශ්‍ය වෙනත් සුදුසුකම්**

- ඉහළ අභිප්‍රේරිත බව, සමග දුර ගමන් බිමන් යෑමට සැදීපැහැදී සිටීම.
- ඉංග්‍රීසි භාෂාවෙන් ලිවීම, කථාකිරීම හා වැඩකිරීමේ හැකියාව සමග Microsoft Office පැකේජයන් තුළ නිදහසේ වැඩකිරීමේ හැකියාව.
- වෙනත් දේශීය භාෂාවලින් වැඩකිරීමේ හැකියාව තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.
- ස්වාධීනත්වයේ ඉහළ මට්ටම, නම්‍යශීලීබව හා නියමිත වේලාවට පෙර වැඩකිරීමේ හැකියාව.

**ගෙවීම :** පූර්ණ කාලීන - මාසික ගෙවීම (ගිවිසගත හැක) උපදේශක විසින් යෝජනා සමග ඉදිරිපත්කළ යුතුය.

අර්ධ කාලීන - පැයට ගෙවීම (ගිවිසගත හැක) උපදේශක විසින් යෝජනා සමග ඉදිරිපත්කළ යුතුය.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :** QCBS(70%for Quality,30%for Cost)

**සේවා ස්ථානය :** කොළඹ,

මේ සම්බන්ධ උද්යෝගයක් දක්වන අයදුම්කරුවන්හට අපගේ වෙබ් ලිපිනයෙන් www.sapp.lk TOR බාගත කළහැක. (DOWNLOAB ශීර්ෂය හා 'PROCUREMENT' උපශීර්ෂය අදාළ TOR බාගත කිරීම සඳහා පරිශීලනය කරන්න)

ඔබගේ යෝජනා (TOR හි සඳහන් ලෙස සියලු විස්තර ඇතුළත් සම්පූර්ණ සාරාංශයක්) තැපෑලෙන් හෝ අතින් 2023 අප්‍රේල් 18 ප.ව. 2.30 හෝ ඊට පෙර පහත ලිපිනයට එවීම හෝ ඊමේල් මඟින් procurement@sapp.lk වෙත අදාළ තනතුර විෂයය ශීර්ෂයේ සඳහන් කරමින් එවීම කළ හැක.

ඉල්ලුම් කරන තනතුර, ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ හෝ විද්‍යුත් ලිපිනයේ විෂයක ශීර්ෂයේ සඳහන් කර එවීමට කාරුණික වන්න.

**සභාපති,**
**උපදේශක ප්‍රසම්පාදන කමිටුව - ව්‍යාපෘති (CPCP),**
**සුළු පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන,**
**නො. 212/A, නාවල පාර, රාජගිරිය.**

**සීමිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් සම්බන්ද කරගනු ලැබේ.**